# බළන්ගොඩ නගර සභාව

## 2020-01-21 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020-01-21**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

ලැබුවා වූ 2020 නව වසර සියළු දෙනාට සුභ නව වසරක් වේවායි පතමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2019-12-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.-

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2019-12-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ. මලීක්ෂා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, සභා වාර්තාවේ 34 වන පිටුවේ පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ තම අදහස් දැක්වීමේදී, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ජනාධිපතිව සිටින සමයේ අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කල බව සටහන්ව ඇති අතර එය ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය බවට වෙනස් විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, 12 වන පිටුවේ තම අදහස් දැක්වීමේ "ක්‍රීඩා පිටිය සඳහා විදුලි ආලෝකය ලබා ගැනීම වෙනුවෙන් පළාත් සභා මුදල් වෙන් කළ බව" යනුවෙන් සටහන්ව ඇති කොටස "නගර සභා මිදුල තාර දැමීම වෙනුවෙන් පළාත් සභා මුදල් වෙන් කළ බව" යනුවෙන් වෙනස් විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, සභා වාර්තාවේ සංශෝධනයන් ලෙස 20 පිටුවේ මුදල් කමිටුවේ සභාපති ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා යනුවෙන් සටහන්ව ඇති අතර එය කර්මාන්ත කමිටුවේ සභාපති ලෙස වෙනස් විය යුතු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 56-1906 දරණ කෲ කැබ් රථය, ND-5124 දරණ වෑන් රථය හා PF-4006 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය යන වාහන තුන සඳහා ලීටර් 600 ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබා දීම සුදුසු බවට පසුගිය සභාවාරයේදී යෝජනාවක් ගෙන ආවද එය විධිමත් පරිදි න්‍යායපත්‍රයට ඇතුළත් නොකළ යෝජනාවක් වන බැවින් එම කොටස සභා වාර්තාවෙන් ඉවත් විය යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ඉතා අබලන්ව පැවති කහටපිටිය මාර්ගය, බෝම්බුව මාර්ගය පළල් කර මාර්ග උරහිස පිරවීම සඳහා හා පෙට්ටිගල මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබා දීම පිළිබඳ පළාත් මාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාට හා බළන්ගොඩ විධායක ඉංජිනේරුතුමාට බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ගරු උප සභාපති, මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සභාවේ සියළු දෙනා වෙනුවෙන් ස්තූතිය පළ කරන බව පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා පෙ.ව.10.35ට සභාව වෙත පැමිණෙන ලදී.

- මව්බිම පුවත්පතේ "ඉන්න නොහිතෙන නගරයකි බළන්ගොඩ" යනුවෙන් පළ කර ඇති ලිපියෙහි පරණ ඡායාරූප ප්‍රමාණයක් සමඟ ඉදිරිපත් කර ඇති විවේචන සාධාරණ නොවන බව ද එම මාතෘකාව බළන්ගොඩ වැනි නගරයකට උචිත නොවන බව ද සඳහන් කළ අතර ඒ පිළිබඳ තම කණගාටුව ප්‍රකාශ කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- **ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.**

  "රාජ්‍ය ආයතන සහ ජාතික වැදගත්කමක් ඇති ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම" යන 2019.04.23 දිනැති PS/SP/SB/C/14/2019 අංක දරණ ජනාධිපති චක්‍රලේඛය හා "ජාතික ආරක්ෂාවට සහාය වීම සඳහා ගම රැකුම සංවිධාන, ග්‍රාම නිළධාරී කොට්ඨාශ මට්ටමින් ආරම්භ කිරීම" යන 2019.06.07 දිනැති PS/PCMD/C/14/2019 අංක දරණ ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව ජාතික ආරක්ෂාව සඳහා දැනට ගෙන යන ක්‍රියාමාර්ග සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

  **ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා පෙ.ව.10.46ට සභාව වෙත පැමිණෙන ලදී.**

- **දොරවෙල මුගුණමලය දෙවන පටුමඟ පිවිසුම අසල අනවසර ඉදිකිරීම සම්බන්ධවයි.**

  බළන්ගොඩ, දොරවෙල, මුගුණමලය ග්‍රාමයෙහි දෙවන පටුමගහි පිවිසුම අසළ නිවැසියන් වන සුමින්ද චම්පික යන අය විසින් අනවසර ඉදිකිරීමක් ලෙස පවත්වාගෙන යන පැති බැම්ම මගින් එකී මාර්ගය භාවිතා කරනු ලබන ප්‍රදේශවාසීන් රැසකට වලංගු ප්‍රවේශ මාර්ග අයිතිය අහිමි වීම හේතුවෙන් ගැටලු රාශියක් උද්ගතව ඇති බව පවසා දොරවෙල, මුගුණමලය දෙවන පටුමග ජනතාව විසින් එවා ඇති පෙත්සම ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, මුගුණමලේ ග්‍රාමය 2005 මැතිවරණයේදී නගර සභා සීමාවට එකතු වූ නමුත් මෙම ගමට යාම

සඳහා මාර්ගයක් නොතිබූ අතර තම පාලන කාලයේ දී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනාවක් පරිදි ලක්ෂ 75 ක මුදලක් වියදම් කර මෙම මාර්ගය ඉදි කළ බව පවසන ලදී. එම සංවර්ධනයේදී ඉදිකරන ලද බැම්ම කඩා වැටුණු පසු ඉහත නම සඳහන් පුද්ගලයා විසින් නැවත වරක් එම බැම්ම ඉදි කළ නමුත් ඔහු විසින් අලුතෙන් බැම්මක් ඉදි නොකළ බව පවසන ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් එම බැම්ම එම පුද්ගලයා විසින් ඉදි නොකළේ නම් පරණ බැම්ම කඩා වැටීම නිසා නගර සභාව වෙත විශාල වියදමක් දැරීමට සිදුවන බව පවසන ලදී. එමෙන්ම මෙවන් ගැටළුවක් දුනුමඩලගහවත්ත මාර්ගයේ, අක්කර 18 ප්‍රදේශයේ ද සිදු වූ අතර එම අවස්ථාවන් දෙකෙහිදීම සභාව නිශ්ශබ්දව සිටි බව ද මේ සඳහා සභාව විසින් පොදුවේ තීරණයක් ගත යුතු බව ද මෙම බැම්ම මොහු විසින් අලුතින් ඉදි කළ බැම්මක් නොවන අතර අවුරුදු 15-20 කට පෙර ඉදි කළ බැම්මක් බැවින් මෙම බැම්ම සඳහා ගන්නා තීරණයම එම බැම් සඳහා ද ගත යුතු බව පවසන ලදී.

තව වසර 10-15 කට පසුව මෙය ගැටළුවක් වන නමුත් ඉඩම් පවරා ගැනීමේ බලය නගර සභාවට නොමැති අතර එය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතුවන බව ද සැම දෙනා සඳහාම පොදුවේ තීරණයක් ගත යුතු අතර අවශ්‍ය නම් අදාළ දෙපාර්ශවය ගෙන්වා සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් දෙපිරිස අතර සාකච්ඡාවක් සභාවේදී පවත්වන ලෙසත්, එසේ විසඳුමකට එළඹීමට නොහැකි වුවහොත් නීතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් දෙපාර්ශවය ගැනම සිතමින් පවත්නා නීතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙම මාර්ගයේ අඩි 19 ක ප්‍රමාණයක් පවතින අතර දේශපාලන වාසියක් ගැන නොසිතා ඉදිරිය ගැන සිතා කටයුතු කරන ලෙස පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මේ සඳහා හොඳම විසඳුම ස්ථානීය පරීක්ෂාව සිදු කිරීම බව පවසන ලදී.

- **මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම.**

  මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තුවන අතර ඒ සඳහා යෝග්‍ය වන රජය සතු පර්චස් 20 ක පමණ භූමියක් ලබා දෙන ලෙස කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුන් විසින් සභාගත කරන ලදී.

  මේ සඳහා දොරවෙල ගඟෙන් පිටුපස කොටස ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය පළ විය.

- අංක 329, දෙල්ගස්වත්ත, හුනුකුඹුර, බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි එස්.සෙල්වකුමාර් මහතා විසින් තම නිවසේ පිටුපස එනම් නිවාස කිහිපයක් සඳහා ගමන් කරන මාර්ගයේ කොටසක් තම නිවස පිටුපසට කඩා වැටී නිවසට ද හානි සිදු වී ඇති අතර මේ සඳහා සාධාරණ විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තමා එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලූ අතර මාර්ගයේ කොටසක් කඩා වැටී ඇති අතර මෙම ඉවුර සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

- 55/3, දොරවෙල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි රිචඩ් ප්‍රැන්සිස් මහතා විසින් එම ස්ථානයේ ස්වයං රැකියාවක් කරගෙන යන අතර බළන්ගොඩ නගර සභාවට අයත් පර්චස් දෙකක පමණ ඉඩම් කොටසක ස්වයං රැකියාවට අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර ගෙන ඇති බවත්, එම පර්චස් දෙකක පමණ ඉඩම් කොටස තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සාධාරණ බදු මුදලක් අයකර ලබා දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- **පොදු වෙළෙඳසැල අංක 04 කඩ කාමරය සම්බන්ධවයි.**

  පොදු වෙළෙඳසැල අංක 04 කඩ කාමරයේ බදු ගැණුම්කරු වූ ටී.ඩී.එම්.ආර්.චන්ද්‍රරත්න මහතා විසින් දිනපතා මහජන පොළ විවෘත කිරීම නිසා තම කඩ කාමරයේ ව්‍යාපාරික කටයුතු අඩාල වී ඇති බැවින් ඒ පිළිබඳ කරුණු ගරු සභාව වෙත පැහැදිලි කිරීම සඳහා අවස්ථාවක් දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් අතුරු බදු දී ඇති කඩ කාමර සභාව වෙත පවරා ගෙන මෙම කඩ හිමියාට ලබා දෙන ලෙස පවසන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එසේ වෙනත් අයකුගේ කඩයක් ලබා දීම සාධාරණ නොවන බැවින් වසා ඇති කඩ කාමරයක් තිබේනම් ලබා දිය හැකි බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල සියළුම එළවළු කඩ සඳහා මේ වන විට ආදායමක් ලැබිය නොහැකි තත්වයක් උදා වී ඇති හෙයින් එම කඩ හිමියන් සඳහා වෙනත් ස්ථානයක් ලබා දිය නොහැකිද යන්න විමසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම ලිපිය මඟින් කඩ කාමර හිමිකරු ඉල්ලා සිටින්නේ සභාව සමඟ සාකච්ඡාවක් සිදු කිරීම බැවින් ඔහුට එම අවස්ථාව ලබා දීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව පොදු වෙළෙඳසැල් අංක 4 කඩ කාමර බදු ගැනුම්කරු ටී.ඩී.මයුර චන්ද්‍රරත්න මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්වීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

එම සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

න්‍යාය පත්‍රයේ මේ සම්බන්ධ යෝජනාව 06ඃ01ඃ04 යටතේ පවතින අතර එම අවස්ථාවේදී මේ පිළිබඳව තීරණයක් ගැනීමට සුදුසු බව සභාවේ තීරණය විය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත මිළ ගණන් විවෘත කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

මිළ ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පෙ.ව.11.39ට සභාව වෙත පැමිණෙන ලදී.

**04ඃ01 ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා Truck රථයක් මිළදී ගැනීම/සභාව සතු ZA-0228 දරණ ගිණි නිවන රථය හා LL-2110 ජල බවුසරයට අවශ්‍ය ටයර් ලබා ගැනීම සඳහා කැඳවූ මිළ ගණන් විවෘත කිරීම.**

- ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා Truck රථයක් මිළදී ගැනීම සඳහා IDEAL මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර පහත දැක්වෙන වර්ග (Model) අනුව පහත පරිදි මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි.

| විස්තරය | BMT PLUS MDI 2WD PS BSIV 1,995,000.00 | BMT PLUS MDI PS 2WD WITH A/C BS IV 2,070,000.00 | BMT PLUS MDI PS 2WD SPECIAL 2,175,000.00 | MAHINDRA BIG BOLERO MDI WITH PS 2,345,000 |
|---|---|---|---|---|
| නිෂ්පාදිත රට | India | India | India | India |
| නිෂ්පාදිත වර්ගය | 2019 | 2019 | 2019 | 2019 |
| තට්ටුවේ ප්‍රමාණය | 8X5 Feet | 8X5 Feet | 8X5 Feet | 9X5 Feet |
| වාහනයේ බර | 2670Kg | 2670Kg | 2670Kg | 3425Kg |
| සිලින්ඩර ධාරිතාව | 4 | 4 | 4 | 4 |
| ගියර් ගණන | 5 | 5 | 5 | 5 |
| ඉදිරිපස බ්‍රේක් | Disc | Disc | Disc | Disc |
| පසුපස බ්‍රේක් | Drum | Drum | Drum | Drum |
| බැටරිය | 65 Am | 65 Am | 65 Am | 65 Am |
| ටයර් ප්‍රමාණය | 195/80 RISLT | 195/80 RISLT | 195/80 RISLT | 700 RIS |
| Power Steering | Only Power | Only Power Steering | Only Power Steering | Only Power |

IDEAl Motors වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව වාහනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීම සඳහා එම ආයතනයේ නියෝජිත මහතෙකු පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව සඳහා ගෙන්වා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය විස්තර ලබා ගනිමින් සුදුසු වාහනය ලබා ගැනීම පිළිබඳ සුදුසු තීරණයක් ලබා ගැනීමට තීරණය විය.

- සභාව සතු ZA-0228 දරණ ගිණි නිවන රථය හා LL-2110 ජල බවුසරයට අවශ්‍ය ටයර් ලබා ගැනීම සඳහා ආයතන තුනකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර Ceat වර්ගයේ ටයර් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ක්‍රවුන් ටයර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් 700 X16 ටයර් 01 ක් රුපියල් 14,050.00 බැගින් ටයර් 06 ක්ද, 700X15 ටයර් 1ක් රු.13,200.00 ලබා ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය විය

**04:02 ක්‍රීඩා පිටියේ පහන් කණු සඳහා අවශ්‍ය සෝඩියම් හැල්ජන් සෙට් 50ක් මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් විවෘත කිරීම.**

- ක්‍රීඩා පිටියේ පහන් කණු සඳහා අවශ්‍ය සෝඩියම් හැල්ජන් සෙට් 50ක් මිළදී ගැනීම සඳහා ආයතන තුනකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති LED World (Pvt) Ltd වෙතින් මිළදී ගැනීමට තීරණය විය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා ක්‍රීඩා පිටියේ ආලෝක පහන් අලුත්වැඩියාව සඳහා 400W සෝඩියම් බල්බ් අවශ්‍ය වුව ද නෝමල් ෆ්ලැෂර් බල්බ් ගෙන ආ බවට අදාළ බිල්පත හා සැසඳීමේදී අනාවරණය වීමෙන් පසු නැවත වරක් එම බල්බ් මාරු කර ගැනීම සඳහා සභාවේ වාහනය කොළඹ යැවීම නිසා වියදම් වූ මුදල පිළිබඳව ද විමසන ලද අතරතුරදී අදාළ විෂය භාර නිළධාරිනිය සභාවට ගෙනවිත් ප්‍රශ්න කරන ලදී. අනතුරුව මේ සඳහා සභාවේ විරෝධතාවය පළ කරන ලදී.

## 05. කල්දී ඇති ප්‍රශ්න

### 05:01 ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය

05:01:01 මුගුණමලේ දඹගහ නිවස අසල අඹගස කපා ඉවත් කිරීමට තව කොපමණ කලක් ගත වේද?

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ අවශ්‍ය ස්ථානීය පරීක්ෂණය සිදුකර ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

05:01:02 පොදු වෙළෙඳසැල් හිමියන් වෙත වෙනත් ස්ථානයක් ලබා දී එය ඉවත් කිරීමට කටයුතු කරන්නේ කවදාද? එහි උපදේශන ගාස්තු ගෙවා කොපමණ කලක් ගතවේද? මේ සඳහා ඉදිරියට ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද?

මෙයට අදාළ උපදේශන ගාස්තු මෙතෙක් ගෙවා නොමැති අතර ආණ්ඩුවේ වෙනස් වීමත් සමඟ මෙම කාර්යය ප්‍රමාද වන බව ද පවතින රජයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගනිමින් ඉටු කළ යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල සඳහා මහල් පහකින් යුත් ගොඩනැගිල්ලක් සුදුසු නොවන බවත්, මේ සම්බන්ධව කිසිඳු මන්ත්‍රීවරයෙකු සමඟ හෝ ව්‍යාපාරිකයන් සමඟ හෝ වෙළෙද සංගමය සමඟ සාකච්ඡා සිදු නොකළ බවත්, මේ සඳහා උපදේශන ගාස්තු නොගෙවන ලෙසත් පවසන ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ වෙළෙද සංගමය සමඟ සාකච්ඡා සිදු කර මහල් තුනකින් සමන්විත පොදු වෙළෙඳසැල නිර්මාණය කිරීමටත්, අදාළ සැලසුම නිර්මාණය කළ පසු මන්ත්‍රීවරුන් සියළු දෙනා කැඳවා එහි අඩුපාඩු සකස් කිරීමට බලාපොරොත්තු වූ බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු මඟින් සැලසුම සකස් කර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමැතිය ලබා

ගැනීමට හැකිනම් ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව අවම වන බව පවසන ලදී. එමෙන්ම ව්‍යාපාරිකයන් සමඟ ද සාකච්ඡා කළ යුතු අතර අනාගතය පිළිබඳ සිතමින් සැලසුම් කර මෙය ඉදි කළ යුතු බව ද අද වන විට සංචාරකයෙක් පැමිණි පසු යාම සඳහා අවශ්‍ය වැසිකිළියක් හෝ බළන්ගොඩ නගරයේ නොමැති බව ද පවසන ලදී.

05ඃ01ඃ03 කුකුල්මස් කඩ හිමියන්ගේ ඕපන් පීෂර් ඉවත් කිරීමට පළාත් සභාව විසින් පියවර ගෙන ඇති බව මීට මාස හයකට පෙර සඳහන් කර සිටියත් මේ වන විටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

හිටපු ගරු සබරගමු පළාත් ආණ්ඩුකාරතුමා විසින් ගෙන ආ මහජන සෞඛ්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි ඇති "ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" තුළ "මාශ වෙළෙඳසැලක ගබඩා කිරීම, විකිණීම හා ප්‍රද්ර්ශනය කිරීම, විකිණීම සඳහා තබා ඇති මාංශ ප්‍රසිද්ධ ස්ථානයකට, මාර්ගයකට හෝ මාර්ගයක ගමන් කරන අයෙකුට නොපෙනෙන සේ තැබිය යුතුය" යනුවෙන් වගන්තියක් පවතින නමුත් මේවන තෙක් එය ගැසට් කර නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා පවසා සිටියේ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ මේ පිළිබඳව සඳහන්ව ඇති බවයි. ඒ අනුව නගර සභා ආඥා පනත සමඟ අතුරු ව්‍යවස්ථා සකස් කරනුයේ සභාවට අදාළ නීතිරීති පවත්වා ගෙන යාම සඳහා වන අතර රැකියා අහිමි වන බව පවසා මෙය නතර නොකර සිටීම ගැටළුවක් වන බව සඳහන් කළේය. එසේනම් පොදු වෙළෙඳසැලෙහි ආදායම් අඩු නිසා එළවළු වෙළෙන්දන් හට ද ඔවුන්ට අවශ්‍ය ස්ථානයක වෙළඳාම් සිදු කිරීමට හැකියාවක් තිබිය යුතු අතර නීතිය කාටත් සමාන විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් අවම වශයෙන් මස් ප්‍රදර්ශනය කර විකිණීම හෝ නතර කිරීමට හැකිනම් එසේ සිදු කරන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා පවසා සිටියේ සෑම සභාවකම මෙම ගැටළුව පිළිබඳව සාකච්ඡා වන බැවින් ඕපන් පීෂර් සඳහා සභාවේ මන්ත්‍රීවරුන් කීදෙනෙක් කැමතිද යන්න ඡන්ද විමසීමක් සිදු කිරීම සුදුසු බව ද අතුරු ව්‍යවස්ථාවක් සකස් කර කුලිය වැඩිකිරීමට හෝ එසේ ගෙවිය නොහැකි අය එය නතර කළ යුතු බවට වශයෙන් කොන්දේසි සමඟ සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද මේ තුළින් ආදායමක් ලබමින් කණ්ඩායමක් ජීවත් වෙන අතර නගර සභාව සඳහා ද ආදායමක් ලැබෙන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් මෙය මහජනතාවට පහසුවක් වන අතර මාර්ගයට නොපෙනෙන සේ ස්ටිකරයක් ඇලවීම සුදුසු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මාර්ගයට නොපෙනෙන සේ හරවා තැබීමට කටයුතු කිරීම සුදුසු බවත්, මේ පිළිබඳ සංගණනයක් සිදු කරන ලෙසත් අදාළ නිළධාරීන්ට උපදෙස් දෙන ලදී.

05:01:04 ට්‍රැක්ටර් ගමන්කල නොහැකි මාර්ගවල ගමන්කිරීමට ගනු ලබන මැක්සි ට්‍රක් රථය ගනු ලබන්නේ කවදාද?

මෙවර සභාවේදී මේ සඳහා ඉදිරිපත් කරන ලද මිළ ගණන් විවෘත කරන අතර, ඒ අනුව අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව පවසන ලදී.

05:01:05 අනඳමෙත්ගම මුගුණමලේ මාර්ගයේ මැද පිහිටා ඇති ටෙලිකොම්, ඩයලොග් කණු ඉවත් කිරීමට ගෙන ආ යෝජනාවට ගෙන ඇති පියවර හා ඔවුන් ඒ සඳහා දක්වා ඇති ප්‍රතිචාර කුමක්ද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, නගර සභාව විසින් අදාළ ආයතන දැනුවත් කර ඇති අතර ඔවුන් විසින් එම කණු ඉවත් කිරීම සඳහා අවශ්‍ය ස්ථානීය පරීක්ෂාව සිදු කරන ලද බව පවසන ලදී.

05:01:06 විදුලිබල මණ්ඩලය මගින් කණු ඉවත් කිරීමට ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබේද? එම ආයතන සඳහා ලිපි ඉදිරිපත් කරන ලද දින කවරේද?

ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු විදුලි බල මණ්ඩලය විසින් ඉදිරියේදී ඉදිරිපත් කරන බව මෙයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමන් පවසන ලදී.

05:01:07 මුගුණමලේ සුසාන භූමිය පවරා ගැනීම සම්බන්ධයෙන් වර්තමාන තත්වය කුමක්ද?

මෙහිදී පරිසර අධිකාරිය මේවන තෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අදාළ වාර්තාව ලබාදී නොමැති ලබා දුන් විගස අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

05:01:08 මුගුණමලේ කුඹුරු ඉඩම් ගොඩ කිරීම පිළිබඳ වර්තමාන තත්වය කුමක්ද?

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන්, දැනට ගොඩ නගර ලද කුඹුරු ඉඩම් පෙර පැවති තත්ත්වයට පත්කරන ලෙසට බුලත්ගම ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරී විසින් අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව සභාව වෙත දන්වා ඇති බව පවසන ලදී.

**05෴02 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

05෴02෴01 2019-11-26 දින විශේෂ මහ සභාවේදී මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සබරගමුව පළාතෙන් පිට, රියදුරෙකු නොමැතිව කුළියට දීම සම්බන්ධව විමසූ නමුත් ඒ ගැන නිශ්චිත දැනුවත් කිරීමක් නොකල බැවින් ඒ ගැන ගරු සභාව වෙත කරුණු හා සියළුම වාර්තාවන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

| | |
|---|---|
| කුලී ගැනුම්කරු- | ඩබ්.එම්.අජිත් අනුර වීරසිංහ,<br>දම්වැල් ඕඩය,<br>කොටවෙහෙරමංකඩ,<br>තණමල්විල. |
| රියදුරු - | ජී.ඒ.නුවන් නිශාන්ත බණ්ඩාර,<br>ඇල්පිටිය,<br>අංකලම්පන්න. |
| ලබා දුන් දිනය- | 2019-09-23 |
| ලැබූ මුදල - | 205,399.22 |

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා 2018-5-28 දින මෝටර් ග්‍රේඩරය කුළියට ලබා දීම සඳහා ගාස්තු අයකිරීමේ සභා තීරණය පරිදි පැය 06කට අඩු ඕනෑම කාලසීමාවක් සඳහා දිනකට රු.18630.00 ක් අයකළ යුතු නමුත් මෙමගින් එතරම් ආදායමක් ලැබී නොමැති බවද මෙම වාහනය ලක්ෂ 225 ක් වටිනා නගර සභාව සතු වත්කමක් බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සභාවේදී අනාවරණය නොකර විමර්ශන කණ්ඩායමක් පැමිණියේනම් සභාවේ නිළධාරින් සියළු දෙනා- අපහසුතාවයකට පත්වන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ප.ව.01.15ට පමණ සභාවෙන් පිටව යන ලදී.

**05෴03 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

05෴03෴01 සභාපතිතුමාගේ පාලන කාලය තුළ නගර සභාවෙන් බදු දී ඇති කඩ කාමර බදුකරුවන්ගේ ඉල්ලීමට කොපමණ කඩ ප්‍රමාණයක නම් වෙනස් කර තිබේද

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා කාර්පාක් අංක 20 දරණ කඩ කාමරය හා පදික කඩ අංක 185/10 කඩ කාමරයෙහි නම් වෙනස් කර ඇති බව පවසන ලදී.

05෴03෴02 2019 වර්ෂයේ ඉටු කළ සංවර්ධනයන්, එම කර්මාන්ත ඉටු කළ කොන්ත්‍රාත්කරුවන් සහ දෛනිකව කළ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ලබා දෙන්න.

| කර්මාන්තය | ඉටුකළ ආකාරය |
|---|---|
| දෙහිගස්තලාව දෙවන පටුමග තාර යොදා සංවර්ධනය කිරීම | දිමුතු සුහසාධක සමිතිය |
| මුගුණමලේ සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් අතුරා සහ පඩි යොදා සංවර්ධනය කිරීම | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| පරගහඅරාව ගොඩහේන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| දෙහිගස්තලාව තලාව මාර්ගයෙන් ආරම්භ වන වැසි ජල කාණු කොටසක් දිකිරීම | අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| වැවේ ළිඳ මාර්ගය වැසි ජල කාණුව ඉදි කිරීම | දිමුතු සුසාධක සමිතිය |
| දොරවෙල පඩි සහිත මාර්ගය බැමි සහ පඩි යොදා සංවර්ධනය කිරීම | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| වැලිහරනාව මාර්ගයේ දෙපස කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම | කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය |
| බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය පුළුල් කර නව පෙරණයක් ඉදි කිරීම | බළන්ගොඩ එක්සත් මිතුරු සංසදය |
| බළන්ගොඩ මහජන පුස්තකාලයේ එළිමහන් අධ්‍යන ඒකකයත් ඉදි කිරීම | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| බළන්ගොඩ නගර සභා කාර්යාලයේ මිදුල පූර්ව මිශ්‍රණය කර අළුත්වැඩියා කිරීම | සභාවේ ඍජු ශ්‍රමය |
| වැලිහරනාව මාර්ගය නඩත්තු කිරීම | සමගි සුහසාධක සමිතිය |
| දෙහිගස්තලාව කුමාරගම මාර්ගය නඩත්තු කිරීම | ශ්‍රී මුතු සුහසාධක සමිතිය |
| සඳුන්ගම මාර්ගය කොටසක් තාර යොදා සංවර්ධනය කිරීම | බුලත්ගම එක්සත් මිතුරු සංසංදය |
| සඳුන්ගම මාර්ගය කොටසක් කාණු සහ බෝක්කු යොදා සංවර්ධනය කිරීම | බුලත්ගම එක්සත් මිතුරු සංසංදය |
| පුපුලවත්ත මාර්ගය කොන්ක්‍රීට් සහ බෝක්කු යොදා සංවර්ධනය කිරීම 2 අදියර | ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය |
| පුපුලවත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම 1 අදියර | ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය |
| ඕළුගංතොට ගංගාරාම මාර්ගයේ රැදවුම් බැම්ම ඉදිකිරීම. | කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය |
| කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) වැසි ජල කාණු කොටසක් ඉදිකිරීම. | දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසින්ගේ සුහසාධක සංගමය |
| කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) පළමු පටුමග රැදවුම් බැම්ම ඉදිකිරීම. | දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසින්ගේ සුහසාධක සංගමය |
| සුබයිර් අලීම් මාවත වැසිජල කාණු කොටසක් ඉදිකිරීම. | දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසින්ගේ සුහසාධක සංගමය |

| | |
|---|---|
| රිෂානා සර්විස් ඉහළ මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | බ/ප්‍රා/ලේ/ වැඩිහිටි බල මණ්ඩලය |
| උඩඇල්ලේපොල මූකලන්වත්ත පඩි සහිත මාර්ගයේ වැසි ජල කාණු කොටසක් ඉදිකිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |
| උඩකන්ද මාර්ගයේ කාණු කොටසක් සඳහා ක්‍රොන්ක්‍රීට් ආවරණ යෙදීම. | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| ඕළුගංතොට සෙලෝවත්ත මාර්ගයේ වැසි ජල කාණු කොටසක් ඉදිකිරීම. | මෛත්‍රී අවමංගල්‍යාධාර සමිතිය |
| සුදර්ශනගම පළමු පටුමඟ රැදවුම් බැම්ම ඉදිකිරීම. | ජනබල එකමුතු සුභසාධක සමිතිය |
| බළගහමුල නාන ළිඳ පරිශ්‍රයේ රැදවුම් බැම්ම ඉදිකිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |
| තානායම් ගෙදර වත්ත මාර්ගයට විරුද්ධ පස මාර්ගයෙහි කාණුව ඉදි කිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |
| වැලිහරනාව ජල ටැංකිය මාර්ගයේ පළමු පටුමගෙහි වැසිජල කාණු කොටසක් ඉදිකිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |
| මැද කිරිදිගල ශෛලයතලාරාමය මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය |
| බළන්ගොඩ නගර සභා පුස්තකාලය පිටුපස පුස්තකාල පාඨකයින් සඳහා ආහාර ගැනීමට වහළක් සවි කිරීම. | කිත්මිණි අයන් වර්ක්ස් |
| බළන්ගොඩ නගරයේ පවිත්‍රතා වැඩසටහනට සමගාමීව විදුලි පහන් කණු වල තීන්ත ආලේප කිරීම.(වැඩ කුලිය ගෙවීම) | |
| බළන්ගොඩ නගරසභා කාර්යාලයේ ගිණුම් අංශයට කොටසක් එකතු කිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |
| බළන්ගොඩ මහජන පුස්තකාලයේ එළිමහන් අධ්‍යයන ඒකකයක් ස්ථාපිත කිරීම. | සභාවේ සෘජු ශ්‍රමය |

05:03:03 මෙතෙක් කරන ලද කර්මාන්ත වල අසාර්ථක කර්මාන්ත ලබා දෙන්න.

| | |
|---|---|
| පල්ලෙකුඹුර මාර්ගයේ වැසි ජල කාණු කොටසක් ඉදි කිරීම | ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය |
| උඩ ඇල්ලෙපොල මාලිගාතැන්න කුෂන් වර්ක්ස් ඉදිරිපිට කේ.ඩබ්.තුෂාර මහතාගේ නිවස දක්වා යන පාර සකස් කිරීම | මාලිගාතැන්න එකමුතු සුභසාධක සමිතිය |

**05:04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:04:01 මේ වන විට නගර සභාව මගින් අනුමත කරන ලද දැන්වීම් පුවරු කීයක් සවිකර තිබේද? එම දැන්වීම් පුවරු ලබා දුන් ආකාරය සහ ලබා ගත් අයගේ තොරතුරු මොනවාද?

- ටෙන්ඩර් කරන ලද දැන්වීම් පුවරු - 10
- සභාව මගින් පවත්වාගෙන යන පුවරු - 06
- GRS මීඩියා ආයතනය විසින් පවත්වාගෙන දැන්වීම් පුවරු - 15
- 2019 බලපත්‍ර ලබාගත් ස්ථිර පුවරු - 34

- 2019 බලපත්‍ර ලබාගත් ස්ථිර පුවරු - 65

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පී.ආර්.එස් ආයතනය සඳහා එම දැන්වීම් පුවරු ලබා දී ඇති ක්‍රමවේදය කුමක්දැයි විමසා සිටින ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ තමාගේ අනුමැතිය ලබා ගනිමින් ලබා දී ඇති බවයි.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, බළන්ගොඩ නගරයේ චිත්‍ර ඇඳීම නිසා උපකාරක පංති ගුරුවරුන් සඳහා පෝස්ටර් ගැසීමට ස්ථානයක් නොමැති යැයි චෝදනාවක් පවතින බැවින් පී.ආර්.එස් ආයතනය සඳහා ලබා දී ඇති දැන්වීම් පුවරු 16 ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසන ලදී.

ලබන සභාවාරයේදී න්‍යාය පත්‍රයට විධිමත් පරිදි යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**06:01:01 බොඩිලයින් ගාමන්ට් ආයතනයේ වාර්ෂික ගිනි නිවන ආවරණ සහතිකය අලුත් කිරීම.**

බොඩිලයින් ගාමන්ට් ආයතනයේ වාර්ෂික ගිනි නිවන ආවරණ සහතිකය අලුත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නගර සභාව සතුව ගිනි නිවීම සඳහා වාහන මෙන්ම සේවක සංඛ්‍යාව ද ප්‍රමාණවත් නොවන නිසා හා මෙම ආයතනය නගර සභා සීමාවෙන් පිටත පිහිටි ආයතනයක් වන බැවින් තම පාලන කාලය තුළ මෙම සහතිකය ලබා නොදුන් බව පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා අදහස් දක්වමින් මෙම සහතිකය ලබා දීම තුළ එම ආයයතනය ආරක්ෂා වන නමුත් අප ආයතනය වගකීමකට බැඳෙන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් මේ සඳහා අත්සන් කරන ගිවිසුම නිසියාකාරව සකස් කර ඒ අනුව සුදුසු තීරණයක් ගත යුතු බව පවසන ලදී.

ඒ අනුව මෙම සහතිකය ලබා දීමට අදාළ වූ ගිවිසුම ලබන සභාවාරය වෙත ඉදිරිපත් කර එය පරීක්ෂා කර අවශ්‍ය තීරණය ගැනීම සුදුසු බව සභාවේ මතය විය.

**06ඃ01ඃ02 පුස්තකාලය සඳහා බිල් ප්‍රින්ටරයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.**

පුස්තකාලය සඳහා බිල් ප්‍රින්ටරයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා මිළ ගණන් කැඳවීමෙන් අනතුරුව සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව සභාවේ මතය විය.

**06ඃ01ඃ03 කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොස්පේට් මිටි 500 ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොස්පේට් මිටි 500 ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ04 අංක 76, සමගි මාවත, රත්නපුර පාර, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඩී.කේ.සෝමලතා මහත්මියගේ වරිපනම් බදු මුදල අඩු කර ගැනීම පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ආදායම් පරීක්ෂකගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව සභාවේ මතය විය.

**06ඃ01ඃ05 පොදු වෙළෙඳසැල මාළු කඩ අංක 11,12,14 හා 18 කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

පොදු වෙළෙඳසැල මාළු කඩ අංක 11,12,14 හා 18 කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන්, පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක CLG/LG-5/2/1/2 හා 2019.11.05 දිනැති ලිපිය සභාගත කරන ලදී. එමගින් කඩ කාමර ටෙන්ඩර් නොකිරීම තුළ නගර සභාවට මූල්‍යමය අලාභයක් සිදුවන බැවින් පොදු වෙළෙඳසැල අංක 09/10 දරණ කඩ කාමර වලට අදාළව පවතින අධිකරණමය කටයුතු

අවසන් කරන තෙක්, ප්‍රශ්න ගත 09/10 මාළු කඩ හැර අනෙකුත් මාළු කඩ ටෙන්ඩර් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා ඇති බව පවසන ලදී

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනාව පෙර සභාවලදී ද සභාවට ගෙන ආ අතර එහිදී ද දිගින් දිගටම මේ සඳහා විරුද්ධ වූ අතර මාළු කඩ අංක 09,10 ටෙන්ඩර් නොකර ඉතිරි මාළු කඩ පමණක් ටෙන්ඩර් කළහොත් ඒකාධිකාරයක් බිහිවන බැවින් 11,12,14 හා 18 පමණක් ටෙන්ඩර් කිරීමට විරුද්ධ වන බව ද අධිකරණ තීන්දුව ලැබුණු පසු හැකි විගසින් පොදු වෙළෙඳසැල සියළුම මාළු කඩ එකවර ටෙන්ඩර් කරන ලෙස ද, අවශ්‍ය නම් බෙදීමකට වුවද යා හැකි බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අද දින ලබා ගන්නා තීන්දුව සභිකයන් 17 එක්ව ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මාළු කඩ පමණක් ටෙන්ඩර් කිරීමට තමන් විරෝධතාවය දක්වන අතර ටෙන්ඩර් කරන්නේ නම් මාළු ගබඩා ද ටෙන්ඩර් කරන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් මේවන විට මහාධිකරණයේ පවතින නඩුවේ තීන්දුව ලබා දුන් පසුව සියළු මාළු කඩ එකවර ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල මාළු කඩ සම්බන්ධව අධිකරණ කටයුත්තක් පැවතියදී මාළු කඩ අංක 9/10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීමට විරුද්ධ වන බවද නව පොදු වෙළෙඳසැල ඉදි කිරීමට යෝජිතව පවතින අතර එම පොදු වෙළෙඳසැල ඉදි කළ පසු විධිමත් පරිදි මාළු වෙළෙඳාම සඳහා ස්ථානයක් ලබා දිය හැකි බවද, මාළු කඩ කාමර ටෙන්ඩර් කරන්නේනම් සියළු මාළු කඩ එකවර ටෙන්ඩර් කරන ලෙස ද පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාව වෙත යෝජනාවක් ඉදිරිපත් කරමින් රත්නපුර මහධිකරණයේ පවතින WA/25/2019 නඩුව අවසන් වීමෙන් පසුව පොදු වෙළෙඳසැල සියළුම මාළු කඩ එකවර ටෙන්ඩර් කිරීම සුදුසු බව පැවසූ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ06 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානවලට පිරිනැමීමේදී නගර සභාවේ සභාපතිවරයා, බළන්ගොඩ නගර සභාවේ වැඩ අධිකාරී සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන එක් නියෝජිතයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානවලට පිරිනැමීමේදී නගර සභාවේ සභාපතිවරයා, බළන්ගොඩ නගර සභාවේ වැඩ අධිකාරි සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන එක් නියෝජිතයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවට එම නිළධාරීන් තිදෙනාට අමතරව එක් එක් පක්ෂ නියෝජනය කරමින් සභාවේ මන්ත්‍රීවරුන් සිව්දෙනෙකු නම් කර ගැනීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් පවසන ලදී.

ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ගෙන ආ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ07 පොදු වෙළෙඳසැල අංක 04 කඩ කාමරය මේවන විට මුද්‍රා තබා ඇත.ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.**

**06ඃ01ඃ08 පොදු වෙළෙඳසැල කඩ කාමර අංක 03 දරණ කඩ කාමරය පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.**

ඉහත 06ඃ01ඃ07 හා 06ඃ01ඃ08 යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල සියළුම එළවළු කඩ කාමර සඳහා පොදුවේ තීන්දුවක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාව විසින් සභාවේ ආදායම අඩුවීමට අදාළව කුමන තීන්දුවක් ගත්තද එය විගණනයට බඳුන් වුවහොත් එහි වගකීම සභාවට පැමිණෙන බවයි.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා පවසා සිටියේ අද දින සභාවේ ගන්නා තීන්දුව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු අතර මෙමඟින් අහිමි වන ආදායම ඕපන් පීෂර් සඳහා අතුරු ව්‍යවස්ථාවක් ගෙන එමින් එහි කුලිය වැඩි කර ලබා ගත යුතු බවත් එය ගරු ආණ්ඩුකාරතුමා වෙත දන්විය යුතු බවත් පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල අළුත්වැඩියා කරන තෙක් පමණක් මෙම ගාස්තු සංශෝධනය සිදුකරන බවට තීන්දුව ගත යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් සියළුම එළවළු කඩ කාමරයන්හි කුළිය රු.1000.00 දක්වා අඩු කිරීම සුදුසු බවට යෝජනාවක් ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා විසින් පොදු වෙළෙඳසැල කඩ කාමරයන්හි කුළිය 50% කින් අඩු කිරීම සුදුසු බව යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

පොදු වෙළෙඳසැල එළවළු කඩ සියල්ලෙහි මිළ රු.1,000.00 දක්වා අඩු කිරීම සුදුසු බවටත්, 50% කින් අඩු කිරීම සුදුසු බවටත් සභාවේ මත දෙකක් පල වූ බැවින් බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි යෝජනාවක් ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව පොදු වෙළෙඳසැල එලවළු කඩ සියල්ලෙහි මිළ රු.1,000.00 දක්වා අඩු කිරීම විරුද්ධවත්, 50% කින් අඩු කිරීමට පක්ෂවත් සභිකයන් දොළොස්දෙනෙක්ද,

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රි ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
10. ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
12. ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා

විපක්ෂව සභිකයන් තිදෙනෙක්ද,

1. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

2. ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය

ඡන්දය ලබා දුන් අතර ඡන්දය විමසන අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය සභාවේ නොසිටිණි. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු පසු පොදු වෙළෙඳසැල අලුත්වැඩියා කරන තෙක් පොදු වෙළෙඳසැල සියළු එළවළු කඩ කාමරයන්හි කුලිය 50% කින් අඩු කිරීමට වැඩි ඡන්ද නවයකින් (09 කින්) සභාවේ සම්මත විය.

**06:01:09 පොදු වෙළෙඳසැල අංක 08 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම පිළිබඳ සභා අනුමැතිය ලබා ගැනීම.**

පොදු වෙළෙඳසැල අංක 08 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම පිළිබඳ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා මෙම කඩ කාමරයේ බදු කරු වූ ඊ.ජේ.කේ.පී.පියදාස මහතා මිය ගොස් ඇති බැවින් ඔහුගේ පුත්‍රයෙකු වන ඊ.ජේ.කේ.පී.අනුර මහතා විසින් එම කඩ කාමරය පවරා දෙන ලෙස ඉල්ලා ඇති බව පවසන ලදී.

ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ ඉතිරි පුත්‍රයන් දෙදෙනාගේ කැමැත්ත පරිදි ඊ.ජේ.කේ.පී.අනුර මහතාට එම කඩ කාමරය පවරා දීම සුදුසු බව සභාවේ මතය විය.

මෙම කඩ කාමරය සඳහා කීමනි මුදලක් අයකර නොමැති බැවින් ඒ සඳහා කීමනි මුදලක් අය කළ යුතු බවට සභාවේ තීරණය විය. සම්පූර්ණ කීමනි මුදල අයකිරීම ප්‍රායෝගික නොවන බැවින් වර්තමාන තක්සේරු මුදල මත පදනම්ව කීමනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර ඊ.ජේ.කේ.පී.අනුර යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06:01:10 නව බස්නැවතුම්පල ඩී.01/01 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

නව බස්නැවතුම්පල ඩී.01/01 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන ඩී.සී.එස් ද සිල්වා යන අය විසින් කේ.ජී.ඒ.අබේසුන්දර යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු

සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුළිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන කේ.ජී.ඒ. අබේසුන්දර යන අය වෙත කඩ කාමරය ලබා දීමටත් මෙහි මාසික බදු කුළිය 10% කින් වැඩි කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:11 නව බස්නැවතුම්පල ඩී.21 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.**

නව බස්නැවතුම්පල ඩී.21 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන චම්පත් ශ්‍රී කරුණාරත්න යන අය විසින් සුබ්‍රමනියම් බාලසුන්දරම් යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුළිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන සුබ්‍රමනියම් බාලසුන්දරම් යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:12 බස් නැවතුම්පල අංක ඩී -09 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

බස් නැවතුම්පල අංක ඩී -09 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, මෙහි වර්තමාන බදු ගැනුම්කරු වූ කේ.එම්.සීටින් සිල්වා යන අය 2019-03-04 වන දින මිය ගොස් ඇති බැවින් ඔහුගේ භාර්යාව වන එස්.පී.සී.එන්.අබේවර්ධන මහත්මියට පවරා දෙන ලෙසත් කේ.එම්.සීටින් සිල්වා මහතාගේ මරණ සහතිකයේ පිටපතක් හා විවාහ සහතිකයේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර ඇති බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:13 මහජන පොළ අංක 11 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන ඊ.ඒ.ඩී.ඉන්දික නිරෝෂණ යන අය විසින් ටී.ඒ.දීපාල් ගයාන් තෙලේනිස් ආරච්චි යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුළිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන ටී.ඒ.දීපාල් ගයාන් තෙලේනිස් ආරච්චි යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:14 කාර් පාක් අංක 04 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කාර් පාක් අංක 04 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත කඩ කාමරයෙහි බදුකරු වූ බී.කේ.ජිනදාස යන අය මිය ගොස් ඇති බැවින් එම කඩ කාමරයෙහි බදු අයිතිය ඔහුගේ පුත් වන බී.කේ.උපාලි ප්‍රියලාල් ජිනදාස මහතාට ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බවයි.

මෙහිදී බී.කේ.ජිනදාස මහතාගේ බිරිඳ ජීවත්ව සිටීනම් ඇයගේ කැමැත්ත ප්‍රකාශ කළ ලිපිය, ඇය ජීවත්ව නොසිටීනම් බී.කේ.ජිනදාස මහතාගේ අනෙක් දරුවන් විසින් කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපිය සමඟ යළි සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව සභාවේ තීරණය විය.

**06:01:15 කාර් පාක් අංක 13 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කාර් පාක් අංක 13 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන අයි.එම්.නවුෆර් යන අය විසින් එම්.සබ්නම් ආබානු යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුලිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන එම්.සබ්නම් ආබානු යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:16 මැණික් කඩ අංක 08 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

මැණික් කඩ අංක 08 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන වඩුගේ වත්තේ ලුසියා යන අය විසින් ජී.අජිත් ඇල්බට් යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුලිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු ජී.අජිත් ඇල්බට් යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:17 අංක 185/13 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

අංක 185/13 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙහි වර්තමාන බදු ගැනුම්කරු වන කේ.ජී.චන්දන නලින් යන අය විදේශ ගත වීමට බලාපොරොත්තුවෙන් සිටින බැවින්

ටී.ඒ.උපුල් නිශාන්ත යන අය වෙත පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා ඇති බවයි. එබැවින් රු.50,000.00 ක මුදලක් අයකර බදු අයිතිය සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:18 2020 වර්ෂය සඳහා පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත් ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් අනුමැතිය ලබාගැනීම**

| | |
|---|---|
| 01. අයි. ජයරාම් මයා | - සුසානභූමි නඩත්තුකරු |
| 02. ඩබ්. එල්. චන්ද්‍රසිරි තිලකරත්න මයා | - සුසානභූමි නඩත්තුකරු |
| 03. ඒ. තමිල් සෙල්වි මිය | - පෙර පාසල් පාලිකා |
| 04. කේ. රුවිනි නිරුක්ෂිකා මිය | - පෙර පාසල් පාලිකා |
| 05. කේ. නිල්මිණි ජයරත්න මිය | - සෞඛ්‍ය කම්කරු |
| 06. යූ. ඩී. සුගත් කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු |
| 07. එන් හේමන්ති | - සෞඛ්‍ය කම්කරු |
| 08. කේ.ජී කුසුමලතා | - සෞඛ්‍ය කම්කරු |

2020 වර්ෂය සඳහා ඉහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත් ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:19 රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර ගැනිම.**

රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සෑම මසකම පොහොය දිනයන්, අප්‍රේල් 13,14,15 හා මැයි 01 යන දිනයන්හි ගාස්තු නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කරන ලද යෝජනාවගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් සථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:20 LL-7688 කෘ කැබ් රථයේ දොර අගුලු සහිතව දොරවල් පද්ධතිය අලුත්වැඩියා කිරීම හා එයට අදාළ FOTON නිෂ්පාදිත ඉන්ද්‍රා මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුමත කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් පවසා සිටියේ, මේ සඳහා රු.34,211.94 මුදලක් වැය වන බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:21 මහජන පොළ වැසිකිළිය, පොදු වැසිකිළි දෙක සඳහා ජල සම්බන්ධතා තුනක් ලබා ගැනීම සඳහා මාර්ග හා බස්නැවම්පල භූමිය පලුදු කිරීමට අවසර ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ප්‍රධාන ජල සැපයුමට ජල මීටර් තුනක් සවි කර ජලය ලබා ගතහොත් වියදම අඩුවන බැවින් එසේ සිදු කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:22 ජාතික ලේඛනාරක්ෂක පනතේ විධිවිධාන අනුව ලේඛනාගාරයේ ඇති ලිපිගොනු හා ලේඛන අපහරණය කිරීම සඳහා කමිටුවත් පත්කිරීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ලේඛන අපහරණ කමිටුව සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:23 නගර සභා පෙර පාසලට දරුවන් දෙදෙනෙකු ඇතුළත් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

නගර සභා පෙර පාසලට දරුවන් දෙදෙනෙකු ඇතුළත් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා, කරවිකැටිය මාර්ගයේ ජීවත් වන දිළිඳු පවුලක සිටින නිවුන් දරුවන් දෙදෙනා එකම පෙර පාසලකට යාම සඳහා කැමැත්තෙන් පසුවන අතර එම ගමේ පෙර පාසල සඳහා වැඩි වියදමක් දැරීමට සිදු වන බැවින් ඔවුන්ට එසේ වියදම් දැරීමට නොහැකි නිසා මෙම දරුවන් දෙදෙනා නගර සභා පෙර පාසල වෙත ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම හැකියාවක් තිබේනම් එම දරුවන් දෙදෙනා සඳහා අවශ්‍ය පාසල් උපකරණ සභාපති අරමුදල මඟින් ලබා දීමටත් කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06꞉01꞉24 VDRL හා HIV සඳහා රුධිර සාම්පල් ලබා ගන්නා සායනයට කිරි පැකට් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06꞉01꞉25 සෞඛ්‍ය අංශය සඳහා දෛනිකව කම්කරුවන් 20 කගේ සේවය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මිනිසුන් විසින් තම නිවෙස් ඉදිරිපිට තබා ඇති කසළ බෑග් බල්ලන් විසින් ඇද දමන බැවින් මේ පිළිබඳ පරිසර පොලීසිය දැනුවත් කරන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් කසළ ට්‍රැක්ටර් සේවකයින් විසින් ට්‍රැක්ටරය වෙත කුණු දැමීමේ දී ට්‍රැක්ටරයෙන් පිටතට කුණු විසිවී මහජනතාවගේ ඇඟට පවා වැටෙන අවස්ථා දක්නට ඇති බැවින් මේ පිළිබඳ සේවකයින් දැනුවත් කරන ලෙස පවසා සිටින ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:26 සභාවේ ආවරණ අනුමැතියට යටත්ව හදිසි වාහන අලුත්වැඩියාවන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, හදිසි වාහන අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බව පවසන ලදී. එමෙන්ම හදිසි වාහන අලුත්වැඩියාවන් සිදු කිරීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා ආවරණ අනුමැතිය ලබාගැනීමට සභාව වෙත ඉදිරිපත් කිරීම ගැටලුවක් බව පවසන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් එසේ කමිටුවක් පත්කිරීමට අවශ්‍ය නොවන අතර කර්මාන්ත කමිටුව හරහා එය සිදු කර ගත හැකි බව ද එසේ සිදු කරන අවස්ථාවන්හිදී කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා දැනුවත් කරන ලෙස ද පවසන ලදී.

මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳ විශේෂ විෂය දැනුමක් නොමැති අතර වැඩ අධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ සිදු වන බැවින් වැඩ අධිකාරිතුමා පිළිබඳ විශ්වාසයක් තබා අද දින මෙම යෝජනාවට අනුමැතිය ලබා දෙන බව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:27සභාවේ ලියාපදිංචි වී ඇති කේ.ජේ.ඔටෝ සර්විස් හා රිෂානා සර්විස් ස්ටේෂන් ආයතනයෙන් 2020 වර්ෂයේ වාහන සේවා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:28 2020 ජනවාරි 22 සිට පෙබරවාරි 11 දක්වා කර්මාන්ත අංශය මගින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

<u>කර්මාන්ත</u>

01.බැංකියවත්ත ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීම.

02.සුදර්ශන ගම මාර්ගය ඉහළ කොටස තාර දමා නඩත්තු කිරීම.

03.ඇල්ගාවත්ත මාර්ගය මුල කොටස තාර දමා සංවර්ධනය කිරීම.

04.දංගමුව වලව්ව මාර්ගය කාණුව සකස් කර තාර දමා නඩත්තු කිරීම.

05.කරව්කැටිය අර්ජුන මහතා සහ තවත් අයගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම.
06.මිරිස්වත්ත අලාබ්දීන් මාවත සංවර්ධනය කිරීම.
07.පොළ භූමියේ වැසිකිළිය සඳහා ළිඳක් ඉදි කිරීම.

**අවශ්‍ය ද්‍රව්‍ය**

| | | |
|---|---|---|
| තාර බැරල් | - | 30 |
| 1 1/2 ගල් කියුබ් | - | 15 |
| 3/4 ගල් කියුබ් | - | 15 |
| චිප් ගල් කියුබ් | - | 12 |
| වැලි කියුබ් | - | 16 |

(මේ වන විට ගබඩාව සතුව ඇත.)

| | | |
|---|---|---|
| සිමෙන්ති මිටි | - | 50 |
| දර යාර | - | 30 |

**අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

කර්මාන්ත නඩත්තු කටයුතු සඳහා දෛනිකව සේවකයින් 15කගේ සේවය මිළදී ගැනීම.

**රථ වාහන**

| | | |
|---|---|---|
| ටිපර් රථය | - | දින 25 |
| ට්‍රැක්ටර් රථය | - | දින 25 |
| D/D රෝල | - | දින 15 |
| JCB යන්ත්‍රය | - | පැය 20 |

2020 ජනවාරි 22 සිට පෙබරවාරි 11 දක්වා කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නව සංවර්ධන කටයුතු සිදු කිරීමට පෙර නඩත්තු කටයුතු සිදු කරන ලෙසත්, කර්මාන්ත කමිටුව සෑම මසකම පළමු සතියේ බදාදා පැවැත්වීම සුදුසු බවත් පවසන ලදී.

සෑම කොට්ඨාශයකම සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දැනුවත් කිරීම හා අදාළ සංවර්ධන කටයුත්ත අවසන් කර මුදල් ගෙවීමට පෙර කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ නිර්දේශය ලබා ගැනීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා කර්මාන්ත කමිටු සාමාජිකයෙකු ලෙස පත්කර ගැනීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අදාළ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා එම කොට්ඨාශයේ සමිතියක් සඳහා ලබා දීම සුදුසු බව පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් යම් කොට්ඨාශයක සංවර්ධන කාර්යයක් ඉටු කිරීමේදී අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ නිර්දේශය, අනුමැතිය හා අධීක්ෂණය නොමැතිව එම කර්මාන්තයක් ඉටු කළ නොහැකි බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා  අදහස් දක්වමින් එම යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක් වන අතර එමඟින් නිළධාරීන් ද ආරක්ෂාවන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ29 බළන්ගොඩ තානායම බදු දීමේ ගිවිසුම ප්‍රකාරව වාර්ෂිකව කිසියම් ප්‍රතිශතයකින් වැඩිකළ යුතු අතර ඒ අනුව ගාස්තුවට වැඩිකරන ප්‍රතිශතය සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම ව්‍යාපාරයේ ගාස්තුව වැඩි කිරීමට ප්‍රථම එම ව්‍යාපාරයේ ආදායම් තත්ත්වය පිළිබඳ සොයා බලන ලෙසත්, මෙම තානායම බදු දුන් පසුව අලුතෙන් ඉදි කරන ලද හෝටල්, අවන්හල් ආදිය කොපමණ තිබේදැයි සොයා බලන ලෙසත් පවසන ලදී. එමෙන්ම මාසිකව බදු කුළිය වශයෙන් නගර සභාව වෙත රු.250,000.00 ක මුදලක් ගෙවන අතර ජල හා විදුලි බිල් ආදිය සඳහාද විශාල වියදමක් දරණ බැවින් නැවත වරක් මෙය ටෙන්ඩර් කිරීමේදී ගාස්තුව වැඩි කර ටෙන්ඩර් කරන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ වන විට බළන්ගොඩ තානායමේ වහලය දිරාපත් වී ඇතුළත කාමර පවා තෙමෙන තත්ත්වයකට පත්වී ඇති අතර අලුත්වැඩියාව සඳහා යන වියදම බදු ගැණුම්කරුට දරා ගත නොහැකි බැවින් එය නගර සභාව විසින් ඉටු කර දීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, තානායමේ බදු දීමේ ගිවිසුම ප්‍රකාරව බදු කාලසීමාව තුළ සිදුකළ යුතු සියළු අලුත්වැඩියාවන් බදු ගැනුම්කරු විසින් සිදු කළ යුතු බව ද එසේ නගර සභාව විසින් සිදු කිරීමට නම් පළාත් සභාවේ අනුමැතිය ලබා ගනිමින් බදු ගිවිසුම වෙනස් කළ යුතු බව ද පවසන ලදී.

**06෴01෴30 රු.10,000.00 ට වැඩි ජල හා විදුලි බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

රු.10,000.00 ට වැඩි ජල හා විදුලි බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ජල හා විදුලි බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴31 2020-01-01 දින සිට 2020-01-20 දින දක්වා සෞඛ්‍ය අංශය සඳහා කම්කරු ශ්‍රමය මිළදී ගැනීම වෙනුවෙන් සිදුකළ ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් රු.185,000.00 ක මුදලක් සෞඛ්‍ය අංශය සඳහා කම්කරු ශ්‍රමය මිළදී ගැනීම වෙනුවෙන් වැය කර ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් සෞඛ්‍ය අංශයේ වියදම් අනුමත කරන බැවින් එම වියදම සෞඛ්‍ය කමිටුවට හෝ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴32 2020-01-01 දින සිට 2020-01-20 දින දක්වා සෞඛ්‍ය අංශය සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සිදුකළ ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:33 2020-01-01 දින සිට 2020-01-20 දින දක්වා සෞඛ්‍ය අංශය හැර අනෙකුත් වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සිදුකළ ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:34 බළන්ගොඩ නගර සභාවේ විදුණැන පියසේ ගාස්තු සංශෝධනය හා නව පුහුණු වැඩසටහන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විදුණැන පියසේ ඉන්ටනෙට් භාවිතා කිරීම සඳහා පැයකට රු.35 ක මුදලක් අය කරන අතර එය රු.50 දක්වා ඉහත දැමිය යුතු අතර දැනට රාජ්‍ය සේවකයින් සඳහා පමණක් අයකරන පුහුණු වැඩමුළුව සාමාන්‍ය ජනතාවටත් ගාස්තු අය කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බවත් පැවසූ ගරු සභාපතිතුමා Cloud Computing Presentation දෙදින පුහුණු වැඩමුළුව සඳහා දැනට එක් දිනකට අය කරනු ලබන රු.800.00 ගාස්තුව ප්‍රමාණවත් නොවන බැවින් එය රු.1000.00 දක්වා සංශෝධනය කර දෙන ලෙසත් පවසන ලදී.

එමෙන්ම පහත පුහුණු වැඩමුළු ආරම්භ කිරීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

| | | එක් දිනකට ගාස්තුව |
|---|---|---|
| 01 | O/L හා A/L විෂය නිර්දේශයට අයත් පරිගණක හා වෙබ් ක්‍රමලේඛණය පිළිබඳ වැඩමුළුව ගුරුවරුන් සඳහා | රු.1000.00 |
| 02 | O/L හා A/L විෂය නිර්දේශයට අයත් පරිගණක හා වෙබ් ක්‍රමලේඛණය පිළිබඳ වැඩමුළුව පාසල් සිසුන් සඳහා | රු.500.00 |
| 03 | පරිගණක නිසි නඩත්තුව, සයිබර් ආරක්ෂක භාවිතය පිළිබඳ එක් දින වැඩමුළුව | රු.1000.00 |
| 04 | CSM වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ දෙදින වැඩමුළුව | රු.1000.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴35 සංගීත සංදර්ශනයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩා පිටිය ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ග්‍රේට් බොයිස් සංගීත කණ්ඩායම විසින් 2020 පෙබරවාරි 01 වන දින බළන්ගොඩ නගරයේ සංගීත සංදර්ශනයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය ලබා දුනහොත් එහි ක්‍රීඩා කරන දරුවන්ට අසාධාරණයක් වන බව පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් මේ දින වල පාසල්වල නිවාසන්තර ක්‍රීඩා උත්සව පැවැත්වෙන බැවින් ක්‍රීඩා පිටිය මේ කාලය තුළ ලබා දීම සුදුසු නොවන බව ද කොමර්ෂල් බැංකුව අසල ලබා දීම සුදුසු බව ද පවසන ලදී.

ඒ අනුව මෙම සංගීත සංදර්ශනය පැවැත්වීම සඳහා කොමර්ෂල් බැංකුව අසළ ලබා දීම සුදුසු බවට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴01෴36 යශෝධරා විශේෂ පාසලේ ක්‍රීඩා පිටිය එළි පෙහෙළි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06෴01෴38 RC-8183 ට්‍රැක්ටරය හා GK-6227 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07꞉01 ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

07꞉01꞉01 මුගුණමලේ මාර්ගයේ දොරවෙල ඔයට යාබද ඉඩම් පුද්ගලයින් විසින් මාර්ගයට ආසන්නව ගෙන එන බැවින් එය නතර කිරීමට කඩිනමින් පියවර ගැනීම

07꞉01꞉02 ප්‍රධාන බස්නැවතුම්පලේ පවතින ජෙනරේටරය තානායම් බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කර, තානායම සඳහා කුඩා ජෙනරේටරයක් ලබා දී නැවත බස්නැවතුම්පලේ සුදුසු ස්ථානයක එම ජෙනරේටරය ස්ථානගත කිරීම.

07꞉01꞉03 කිරිඳිගල ග්‍රාම නිළධාරි වසමේ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය වෙත සේවා සැපයීම සඳහා ස්ථානයක් නොමැති බැවින් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට රජය සතු ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමන් වෙත හා පළාත් ඉඩම් කොමසාරිස්තුමන් වෙත ඉල්ලීමක් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී තරගනී සමරසේකර මැතිතුමිය 07꞉01꞉01 හා 07꞉01꞉03 යෝජනා පිළිබඳ අදාළ ආයතන දැනුවත් කරන ලෙසත්, තානායම සඳහා කුඩා ජෙනරේටරයක් ලබා දී නැවත බස්නැවතුම්පලේ සුදුසු ස්ථානයක එම ජෙනරේටරය ස්ථානගත කරන ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07꞉02 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

07꞉02꞉01 දෛනික වැඩට යොදවන කම්කරුවන්, කර්මාන්තවල ඇස්තමේන්තු සඳහා සභාවෙන් සභාවට අනුමැතිය ලබා ගැනීම.

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කර්මාන්ත කමිටුව මගින් නිර්දේශ කරන ලද මන්ත්‍රී යෝජනා**

**08ඃ01 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

08ඃ01ඃ01 මුස්තාපා මාර්ගය ආරම්භයේ කාණුව සකස් කිරීම.
08ඃ01ඃ02 මිරිස්වත්ත සුබයිර් ආලීම් මාවතේ කාණුව සකස් කිරීම.
08ඃ01ඃ03 ෆලීල් හාජ්ජියාර් මාවත පහළ කොටස සංවර්ධනය කිරීම
08ඃ01ඃ04 "අවු 12 ට අඩු දරුවන්ට පමණයි" යනුවෙන් ළමා උයනේ දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08ඃ02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08ඃ02ඃ01 වැවේවත්ත උද්‍යාන පාර ඉතිරි කොටස කාණුව සකස් කර සංවර්ධනය කිරීම
08ඃ02ඃ02 සුනන්දාරාම මාවත සංවර්ධනය කිරීම.
08ඃ02ඃ03 වෙළේකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර පැතිබැම්ම සකසා පාර කොන්ක්‍රීට් කිරීම.
08ඃ02ඃ04 බාන්ස් රත්වත්ත මාවතේ තානායම පාර අසල තාප්පයේ ඉදිකරන ලද බිතු කැටයමේ සංරක්ෂණය සඳහා කුඩා වහළක් සැකසීම සහ බල්බයක් දැමීම.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08ඃ03 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා**

08ඃ03ඃ01 අනඳමෙත්ගම කාණු පද්ධතිය සකස් කිරීම
08ඃ03ඃ02 මුගුණමලේ මාර්ගය සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා**

08:04:01 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසළ සොනික් ස්ටුඩියෝ පාර 30 m පමණ ඉදිරියට සකස් කිරීම

08:04:02 අලාබ්දීන් මාවත ඉහළ කොටස සංවර්ධනය කිරීම.

08:04:03 කරච්කැටිය මහමෙව්නා මාවත වීථි ලාම්පු/බල්බ් දැමීම.

08:04:04 පරණ පොදුවෙළෙඳසැල ගොඩනැගිල්ල ඉවත් කර නව පොදුවෙළෙඳසැලක් සාදා ගැනීම හා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:05 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

08:05:01 තලාව මාර්ගය ඉහළ කොටස සංවර්ධනය කිරීම.

08:05:02 කුමාරගම පිරිවෙන පාර සංවර්ධනය කිරීම.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:06 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

08:06:01 චාරිකා ගෙස්ට් අසළ සිට රෝහිණී මහත්මියගේ නිවස දක්වා කාණුව ඉදි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:07 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

08:07:01 බුද්ධ ජයන්ති පාර ප්‍රීමික්ස් යොදා තාර දමා නඩත්තු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09.හදිසි යෝජනා**

**09:01 කාර්යසාධන ණය ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.**

කාර්යසාධන ණය ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.12.02, 2019.12.16, 2019.12.26 දින හා 2019.12.31 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 21,056,252.53 |
| වෙනත් ලැබීම් | 1,241,092.90 |
| මුලු ලැබීම් | 22,297,345.43 |
| පුනරාවර්තන වියදම් | 11,856,007.31 |
| වෙනත් වියදම් | 1,865,471.61 |
| මුලු වියදම් | 13,721,478.92 |

**2019-12-01 දින සිට 2019-12-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 24,960.00 |
| 227-5020 | 54,762.00 |
| | 600.00 |
| | 795.00 |
| 37-7933 | 4,749.99 |
| | 20,100.00 |
| RD - 8240 | 30,710.00 |

| | |
|---|---|
| | 700.00 |
| 56-1906 | 5,200.00 |
| BC-0005 | 38,480.00 |
| GC 0001 | 9,905.00 |
| | 830.00 |
| LL - 7688 | 13,624.00 |
| DPR 0008 | 1,352.00 |
| HF - 8558 | 10,920.00 |
| OV/M 0017 | 4,265.00 |
| GK-1483 | 10,106.00 |
| | 795.00 |
| GK-6227 | 20,836.00 |
| | 795.00 |
| JD-4684 | 1,370.00 |
| LL-2110 | 837.00 |
| ND-5124 | 30,509.44 |
| OS0006 | 1,370.00 |
| PF-4006 | 38,042.40 |
| QL-2901 | 4,384.00 |
| RC-1107 | 29,120.00 |
| ZA 0228 | 538.00 |
| RB-4786 | 21,320.00 |
| RC-8183 | 10,400.00 |
| RE-2600 | 22,880.00 |
| UQ - 1933 | 4,110.00 |
| VI - 1833 | 1,060.80 |
| | 1,233.00 |
| HF-7899 | 51,525.76 |
| SDRR 0013 | 3,120.00 |
| YG-0758 | 2,055.00 |
| ZA 9835 | 11,195.00 |
| ZA - 5039 | 36,400.00 |
| **එකතුව** | **525,955.39** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් සරස්වතී පාර සුසාන භූමියේ ඇති සුසාන ගෙය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැවින් එය හැකි ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

එගොඩ හුණු කුඹුර මාර්ගයේ ජලනල එලීමේදී මාර්ගය විශාල වශයෙන් පළුදු වී ඇති බැවින් එම මාර්ගය හැකි ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම මෙගොඩ හුණුකුඹුර සුනිල් ගරාජය අසළ මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර වර්ෂා කාලයේදී මෙම තත්ත්වය මීටත් වඩා බරපතල විය හැකි බව ද මේ වන විට අත්‍යවශ්‍ය කටයුතු සඳහාවත් වාහන ගමන්කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව ද පවසන ලදී.

එමෙන්ම නඩු තීන්දුවක් මගින් හුණු කුඹුර මාර්ගය සුද්ධ කිරීම සඳහා නගර සභාවට බලය ලබා දී ඇති නිසා ඒ අනුව සුද්ධ කිරීමට කටයුතු කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් කරව්කැටිය උඩකන්ද මාර්ගයේ වරිපනම් බදු නොගෙවන බොහෝ පිරිසක් සිටින බැවින් මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාළ වරිපනම් තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කළ අතර නව තක්සේරුව ක්‍රියාත්මක වීමේදී එම දේපල සඳහා ද එය ක්‍රියාත්මක වන බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නව බස්නැවතුම්පල සඳහා පින්තාලියක් ඉදි කර දෙන ලෙස පවසන ලදී. එමෙන්ම කොටුගොඩැල්ල මාර්ගයට හැරෙන ස්ථානයේ වීථි ලාම්පුවේ ගැටළුවක් පවතින අතර මේ පිළිබඳ සොයා බලන ලෙස ද සේනක පෙදෙසේ වාහන දෙකක් මාරුවිය හැකිව පවතින ස්ථානයේ පවතින විදුලි කණුව හේතුවෙන් වාහන ගැටෙන නිසා එම කණුව ඉවත් කරන ලෙස ද සුනබ ගැටළුව සඳහා මෙතෙක් විසඳුමක් ලබා දී නොමැති බැවින් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ද සඳහන් කළේය.

එමෙන්ම බළන්ගොඩ නගරයේ සවිකර ඇති ඩිජිටල් පුවරු සඳහා ගාස්තුව අඩු කර ඔවුන්ට සහනයක් සලසා දෙන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මේ මොහොත වන විට පුස්තකාලය ඉදිරිපිට සවි කර ඇති ලොතරැයි කුඩුව නිසා රථ වාහන නැවැත්වීමට පවතින දුෂ්කරතාවය තවත් උග්‍ර වී ඇති බැවින් එය හෙට දිනම ඉවත් කරන ලෙස පවසන ලදී.

මීට අමතරව බළන්ගොඩ නගරය සඳහා හෙළ බොජුන්හලක් ස්ථාපනය කිරීම ඝඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ද එසේ සභා අනුමැතිය හිමිවුවහොත් ඒ සඳහා අවශ්‍ය ස්ථානයක් මෙන්ම ප්‍රතිපාදන ද තමන් විසින් සපයා ගන්නා බව ද පොදු වෙළෙඳසැල සම්බන්ධ සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවන්හිදී වෙළෙඳ සංගමය හා මන්ත්‍රීවරුන් සියළු දෙනා ඒ සඳහා කැඳවන ලෙස ද පවසන ලදී.

එමෙන්ම සභාපති අරමුදල යටතේ හෝ යහසාධක සංගමය මඟින් මන්ත්‍රීවරුන් සියළු දෙනා එක්ව විනෝද චාරිකාවක් යාම සඳහා කටයුතු සංවිධානය කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.
එමෙන්ම අද දින සභාවේ දී සාකච්ඡාවට බඳුන් වූ මව්බිම පුවත්පතේ දැන්වීම සඳහා අනවශ්‍ය පින්තූර කිහිපයක් යොදාගෙන ඇති අතර එම මාතෘකාව මෙවැනි නගරයකට සුදුසු නොවන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට බහුතරය නොමැති වුවත් සභාවේ කිසිඳු කාර්යයකට බාධාවක් නොකරන බව ද, සභාව ආරම්භ කිරීමේදී රු.500,000.00 දක්වා ආවරණ අනුමැතියට යටත්ව ගරු සභාපතිතුමාට වියදම් කිරීමේ බලය ලබා දීමට විරුද්ධ වූ අතර එම අවස්ථාවේ තම කණ්ඩායමට බහුතරය නොතිබූ නමුත් මේ වන විට බහුතරය පවතින බව ද පවසන ලදී. එමෙන්ම සභාව විසින් කර්මාන්ත හා සෞඛ්‍ය හැර ඉතිරි වාහන වල ඉන්ධන පමණක් සීමා කළ අතර සභාවේ වියදම් සිදු කිරීමට පෙර සභා අනුමැතිය ලබා ගත යුතු බව පැවසීය. මීට අමතරව මන්ත්‍රීවරුන් විසින් යෝජනා ඉදිරිපත් කළ විට එම යෝජනා සභාවට ඉදිරිපත් කර සභාවේදී ඒ සඳහා පිළිතුරු සපයන ලෙස පවසන ලදී.

එමෙන්ම මොහාන් සාලිය එල්ලාවල මාවත හා බාන්ස් රත්වත්ත මාවත ආරම්භයේ හා අවසානයේ ඩිජිටල් නාම පුවරු දෙකක් සවි කරන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා ගියවසරේ මන්ත්‍රී ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් මෙම වසරේ සංවර්ධන යෝජනා ලබා නොදුන් බව ද මහජන නියෝජිතයින් මහජනතාව සඳහා සේවය කිරීම අවශ්‍ය වන බැවින් සභාපති තනතුර යනු සුන්දර එකක් නොවන බව ද මන්ත්‍රීවරුන් මාසයකට වරක් සභාවට පැමිණියත් සභාපතිතුමා විසින් සියළු දේ ඉටු කළ යුතු බව ද පවසන ලදී.

ගිය වසරේ ගරු සභාපතිතුමා විසින් තනිවම සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර මන්ත්‍රීවරුන් සඳහා කිසිඳු මුදලක් ලබා නොදුන් බව පවසන ලදී. ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත එක ගමකට එක නිවසක් හා රැකියා ලක්ෂයක් ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යනු එකක් බව සඳහන් කළේය. එමෙන්ම පුස්තකාල කමිටුව හා සෞඛ්‍ය කමිටුව පැවැත්වීම සඳහා දින යොදා ගන්නා ලෙසත්, සියළු දේ පිළිබඳ මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙසත් පවසන ලදී.

මීට අමතරව කර්මාන්ත කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා නම් කර ගන්නා ලෙස ද එතුමා නීතිය පිළිබඳ අවධානය යොමු කරමින් කටයුතු කරන බව ද පවසන ලදී. එමෙන්ම තම පාලන කාලයේදී සභාව සඳහා විශාල වශයෙන් වාහන ලබා ගැනීමට හැකි වූ නමුත් සභාව විසුරුවා හැරීම නිසා එයින් ප්‍රයෝජනයක් ගැනීමට නොහැකි වූ අතර ගල්රෝලක් අවශ්‍ය වන්නේ නම් සභාවට මිළදී ගන්නා ලෙස පවසන ලදී.

තමා 1991 සිට නගර සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටි බැවින් තම ජීවිතයේ අඩක්ම නගර සභාව වෙත කැප කර ඇති බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා තමන් මෙම සභාවට පත්වන විට මෙය හරක් මඩුවක්ව තිබූ නමුත් එය ජාත්‍යන්තරය දක්වා රැගෙන ගෙන ගිය බවත්, ඕස්ට්‍රේලියානු රජයෙන් සිදු කළ සමීක්ෂණයක් මඟින් බළන්ගොඩ නගරය ජීවත්වීමට සුදුසුම නගරය බවට නම් කර ඇති බවත් පවසන ලදී.

මහජන නියෝජිතයන් ඡන්දය දුන් නොදුන් සියළු දෙනාටම සේවය කළ යුතු අතර මාධ්‍යවේදීන්ගේ හිත් රිදීමක් සිදුවූවානම් කණගාටුවට පත්වන බව ද නිතරම ක්‍රෝධයෙන් වෛරයෙන් වැඩ කළ නොහැකි බැවින් නිතරම සහයෝගයෙන් වැඩ කළයුතු බව ද පවසමින් ලැබුවා වූ නව වසර සාර්ථක නව වසරක් වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් මෙතරම් වෙලාවක් රැඳී සිටීම පිළිබඳ ස්තුතිවන්ත වන බව ද අද සභාව හොඳ සභාවක් වූ අතර මෙවැනි සභා කිහිපයක් පමණක් පවත්වා ඇති බව ද පරිණත නායකයන්ගේ පරිනත බුද්ධියෙන් සිදු කළ කටයුතු මගින් තමන් බොහෝ දේ ඉගෙන ගත් අතර තම පාලන කාලයේදී කොතරම් හිතට එකගව වැඩ කළත් වෙනත් අයගෙන් සිදු වන වැරදි සඳහා තමාට වගකීමට සිදුව ඇති බව ද පැවසීය. එමෙන්ම සභාවේදී අදහස් හා උදහස් හුවමාරු සිදු කරගනු ලබන්නේ තම පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා නොව මහජනතාව වෙනුවෙන් බව පැවසූ ගරු සභාපතිතුමා එළඹුනු වසරේ සියළු දෙනා එක්ව සමඟියෙන් සහයෝගයෙන් කටයුතු කිරීමටත්, නව්‍යතාවයෙන් යුතුව ඉදිරියට යාම සඳහා හරි වැරදි පෙන්වා දෙමින් සද්භාවයෙන් සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටි අතර, නව වසර සියලු පැතුම් බලාපොරොත්තු සපල වන සුභ නව වසරක් වේවායි පතමින් ප.ව.6.45 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.